

# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
# கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)




සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්.එච්.දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம், (1ம் மாடி), எஸ். எச. தஹநாயக மாவத்தை, காலி.
planning Secretariat Building (1st Floor), S. H. Dahanayaka Mawatha, Galle.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My no | දප/සමූකොම්/චක්‍රලේඛ | මබේ අංකය<br>உமது இல.<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2014.03.31 |

චක්‍රලේඛ අංක 01/2014

දකුණු පළාතේ සියලුම සමූපකාර
සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාතේ සමූපකාර සේවකයින්ට 2014 අයවැය යොජනා අනුව ජීවන වියදම් දීමනාවක් ගෙවීම</u>

දකුණු පළාතේ සමූපකාර සමිතිවල සේවය කරන සේවකයින් වැඩිදෙනෙක් තමන් දැනට ලබන වැටුප් ප්‍රමාණය තමන්ගේ ජීවන වියදමට ප්‍රමාණවත් නොවන බවත්,වර්තමාන ජීවන වියදමට සරිලන ලෙසට වැටුප් වැඩි කිරීමක් හෝ යම් දීමනාවක් වැඩිකරන ලෙසටත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

02. මෙකී සියලු ඉල්ලීම් පිළිබඳව කොමිෂන් සභාව අවධානය යොමුකර, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද 2014 අයවැය යෝජනා අනුව වැඩිකරන ලද රජයේ සේවකයින්ගේ ජීවන වියදම් දීමනාව ද සැලකිල්ලට ගෙන, දකුණු පළාතේ සමූපකාර සමිතිවල සේවය කරන සියලුම සේවකයින්ට රු.1200/= ක ජීවන වියදම් දීමනාවක් ගෙවිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කර ඇති බව දන්වමි.

03. මෙම දීමනාව 2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතුය.

03. තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/පදනම මත හා කැලි පදනම මත සේවය කරන සියලු සේවකයින්ට මසකට දින 21 ට වඩා වැඩිපුර සේවය සපයා ඇත්නම්, සම්පූර්ණ දීමනාව ද දින 21 ට වඩා අඩුවෙන් සේවය කර ඇත්නම්, ඔවුන් වැඩ කළ දින ගණන පදනම් කරගෙන ද මෙම දීමනාව ගෙවිය යුතුය.

04. මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කර ගත යුතුය.

05. තවද, මෙම චක්‍රලේඛය ඔබ සමිතියේ සියලුම සේවකයින්ට දැන ගැනීමට සැලැස්විය යුතුය.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

වසන්ති ගුණසේකර.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත - 1. ලේකම්,ධීවර,සංස්කෘතික......සමූපකාර අමාත්‍යාංශය - දැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් (ද.ප.) - දැ.ස.
3. දිවයිනේ සියලු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් - දැ.ස
4. දප/සමූ/කොම්/ච.ලේ - ගොනුවට